**ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය**
**(නාරා ආයතනය)**
**<u>තනතුරු පුරප්පාඩු</u>**

ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය (නාරා ආයතනය) යනු ශ්‍රී ලංකාවේ ජලජ සම්පත් සම්බන්ධයෙන් පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදු කරන ප්‍රධාන ජාතික ආයතනය වේ.

අප ආයතනය මුහුදු, වෙරළබඩ සහ අභ්‍යන්තර ජලජ සම්පත් පිළිබඳ විද්‍යාත්මක පර්යේෂණ, තාක්ෂණික සංවර්ධන කටයුතු සහ උපදේශන සේවා සපයමින් ජලජ සම්පත් සුරක්ෂිත කිරීම, තිරසාර භාවිතය හා කළමනාකරණය ප්‍රවර්ධනය කිරීමට වැදගත් දායකත්වයක් සපයයි. එමෙන්ම ධීවර හා ජලජ සම්පත් ක්ෂේත්‍රයේ සංවර්ධනයට සහ ජාතික ආර්ථික වර්ධනයට ද නාරා ආයතනය මහත් දායකත්වයක් ලබා දේ.

නාරා ආයතනයේ පහත සඳහන් පුරප්පාඩු වූ තනතුරු සඳහා අදාළ සුදුසුකම් හා පළපුරුද්ද සහිත පුද්ගලයින්ට අවස්ථාව විවර වේ.

| අනු අංකය | තනතුර | සේවා කාණ්ඩය | පුරප්පාඩු ගණන |
|---|---|---|---|
| 01 | ප්‍රධාන විද්‍යාඥ (සාගර විද්‍යාව) | HM 1-3 | 01 |
| 02 | ප්‍රධාන විද්‍යාඥ (පසු අස්වනු තාක්ෂණ) | HM 1-3 | 01 |
| 03 | ප්‍රධාන විද්‍යාඥ (මත්ස්‍ය සැකසීම) | HM 1-3 | 01 |
| 04 | ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ (අභ්‍යන්තර ජලජ සම්පත් සහ ජලජීවී වගා අංශය) | AR-2 | 01 |
| 05 | ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ (සාගර විද්‍යා අංශය ) | AR-2 | 01 |
| 06 | ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ (පසු අස්වනු තාක්ෂණ අංශය ) | AR-2 | 01 |
| 07 | අභ්‍යන්තර විගණක | MM 1-2 | 01 |
| 08 | සහකාර අධ්‍යක්ෂ (පාලන) | MM 1-2 | 01 |
| 09 | දත්ත විශ්ලේෂක | MM 1-2 | 01 |
| 10 | විද්‍යාඥ (අභ්‍යන්තර ජලජ සම්පත් හා ජලජීවී වගා අංශය) | AR-1 | 02 |
| 11 | විද්‍යාඥ (සමාජ, ආර්ථික හා අලෙවිකරණ අංශය) | AR-1 | 01 |
| 12 | විද්‍යාඥ (සමුද්‍ර ජීවි විද්‍යා අංශය) | AR-1 | 02 |
| 13 | විද්‍යාඥ (ධීවර තාක්ෂණික අංශය) | AR-1 | 01 |
| 14 | විද්‍යාඥ (පරිසර අධ්‍යයන අංශය) | AR-1 | 02 |
| 15 | සහකාර තොරතුරු තාක්ෂණ නිලධාරී | JM 1-2 | 01 |
| 16 | අභ්‍යන්තර විගණන නිලධාරී | JM 1-2 | 01 |
| 17 | සහකාර ව්‍යාපෘති අධීක්ෂණ නිලධාරී | JM 1-2 | 01 |
| 18 | තාක්ෂණික නිලධාරී (සිවිල්) | JM 1-2 | 01 |
| 19 | කිමිදුම් නිලධාරී | JM 1-2 | 01 |
| 20 | භූ දර්ශන නිලධාරී | JM 1-2 | 01 |

| | | | |
|---|---|---|---|
| 21 | තාක්ෂණික සහකාර (විද්‍යුත්) | MA 2-2 | 01 |
| 22 | පර්යේෂණ සහකාර | MA 2-2 | 10 |
| 23 | ක්ෂේත්‍ර පර්යේෂණ සහකාර | MA 2-2 | 04 |
| 24 | එන්ජින් කාමර කාර්මික ශිල්පි | MA 2-2 | 01 |
| 25 | කිමිදුම්කරු | MA 2-2 | 01 |
| 26 | කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | MA1-2 | 03 |
| 27 | විදුලි කාර්මික | PL -3 | 01 |
| 28 | බෝට්ටු ක්‍රියාකරු | PL -3 | 01 |
| 29 | මෝටර් කාර්මික | PL -3 | 01 |
| 30 | රසායනාගාර සහායක | PL -2 | 04 |

ඉහත සඳහන් තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් හා වෙනත් විස්තර ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායනයෙහි වෙබ් අඩවිය තුළින් ලබා ගත හැක.(www.nara.ac.lk)

අයදුම්පත් මාර්ගගත ක්‍රමවේදය (online application portal) ඔස්සේ පමණක් ඉදිරිපත් කළ යුතු අතර අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා අයදුම්කරුවන් www.nara.ac.lk වෙබ් අඩවියේ vacancies වෙත පිවිසිය යුතුය.

සියළුම අයදුම්කරුවන් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ සම්පූර්ණ කරන ලද අයදුම්පතෙහි පිටපතක් බාගත කර (Download) දෘඩ පිටපත තමා විසින් අත්සන් කර එය සමඟ මුලික අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සනාථකරන සහතික වල පිටපත් සහ උප්පැන්න සහතිකයේ පිටපතක් ද සමඟ 2026 අප්‍රේල් 06 වන දින හෝ එදිනට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් **අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය, කාක දූපත, මට්ටක්කුලිය, කොළඹ 15** යන ලිපිනයට එවීමට පියවර ගත යුතුය. අයදුම් කරන තනතුර ලියුම් කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි පැහැදිලිව සඳහන් කළ යුතුය.

අයදුම්කරුවන්ගේ උපරිම අධ්‍යාපන මට්ටම හා පලපුරුද්ද පදනම් කර ගනිමින් කෙටි ලැයිස්තු ගතකර විවෘත තරඟ විභාගයකින් හා/ හෝ පත්වීම් බලධාරියා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවන අතර එම පරීක්ෂණයන්හි දී දක්වන කුසලතාව මත තනතුරු සඳහා තෝරා ගැනේ. පත්වීම් බලධාරියා විසින් බඳවා ගැනීම සඳහා තරඟ විභාගයක් අවශ්‍ය යැයි තීරණය කරනු ලැබුවහොත් ඒ සඳහා විභාග ගාස්තු ගෙවීමට ඔබ බැඳී සිටී.

රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩල, සංස්ථා හෝ දෙපාර්තමේන්තුවල ඉල්ලුම්කරුවන් විසින් බාගත කරන ලද තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතු අතර, ආයතන ප්‍රධානීන් මඟින් එවනු නොලබන, ප්‍රමාද වී ලැබෙන, අසම්පූර්ණ, අපැහැදිලි හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොමැති හෝ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**අධ්‍යක්ෂ ජනරාල්**
**ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය**
**කාක දූපත,**
**මට්ටක්කුලිය,කොළඹ - 15**
**011 – 2521000 / 2521006**
(www.nara.ac.lk)